# කවි අහුර

H.M. අහිංසා නෙත්මිණි හේරත්

# කවි අහුර

කර්තෘ : H.M. අහිංසා නෙත්මිණි හේරත්

2 ශ්‍රේණිය E

මහ මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

කර්තෘ ප්‍රකාශනයකි

පළමු මුද්‍රණය : 2023

පිට කවරය : H.M. අහිංසා නෙත්මිණි හේරත්

ISBN Number : 978-624-206-836-7

# පිදුම

මාගේ ආදර

ගුරුතුමියටත්,

අම්මාටත්,

අප්පච්චිටත්

විදුහල්පතිතුමියටත්

ගෞරවයෙන්

පිළිගන්වමි

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක් “ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ “දිවිය දිනන විද්‍යුත් පොතක් “ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.
මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර,

විදුහල්පතිනිය,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

2023 '11 ' 01

# වලාකුළු

බෝල බෝල වලාකුලේ
කොහෙද දුවන්නේ
අපට වැස්ස දෙන්නද මේ
හනික දුවන්නේ



# බලු පැටියා

බෝලේ බෝලේ වගේ පෙරලි පෙරලි
මිදුල පුරා එහෙට මෙහෙට
මාත් එක්ක සෙල්ලම් කර
මගේ සුදු බලු පැටියා



# මල් වත්ත

මල් පිපිලා මිදුල පුරා
සමනලයෝ පියාඹනවා
මල් පැණි බී
සෙල්ලම් කර
හවසට උන් සැඟවෙනවා



# හඳහාමි

හඳහාමි  ඈත අහසේ
කිරි  පිඟාන වාගෙයි රවුම්
හීනෙන්  හරි
කිරි පැණි මට ගෙනත් දෙන්නකෝ



# මාළු විල

මගෙ අප්පච්චිගේ
මාළු විලේ
රතු පාටයි කහ පාටයි
මාළු ගොඩක් ඉන්නවා



# බෝනික්කා

අම්මා ගෙනා බෝනික්කා
මාත් එක්ක හිනාවෙනවා
මා කියනා  සිංදු කතා
අසා    ඉන්නවා



# මුව පැටියා

ළපටි දළු කමින්
මා දෙස බලා ඉන්න
මුව පැටියෝ
කළුවර රෑ කොහෙද ඔයා
සැඟවිලා ඉන්නේ



# හොඳ පුරුදු

බට්ටි කුරුල්ලෙක් උදේම
වැඩට යන්න ඉස්සරලා
වතුර බේසමෙන් නාලා
පිරිසිදු වෙනවා



# ගුරුතුමිය

පාට පාට සාරි අදින
අපෙ පන්තියේ පායන සඳ
එළිය බෙදන අපිව හදන
මගේ ගුරුතුමී



# අත්තම්මා

මාව තුරුළු කරන් නිතර
සුරංගනා කතා කියන
පෝයට සිල් ගන්නට යන
මගේ සුදු අත්තම්මා



# ස්තූතිය

මේ පොත කවි අහුරක් විදියට

නිර්මාණය කිරිමට සහය දුන්

මගේ ආදරණීය

අක්කලා දෙදෙනාටත්

අම්මාටත් ගුරුතුමියටත්

ස්තූති වන්ත වෙමි !

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ, ආර්ථික, පරිවර්තනයන් හේතුකොට ගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක